**පොල් වගාකිරීමේ මණ්ඩලය - 2020**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මතය වියාචනය

**---------------**

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

**------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**----------------------------------------------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 24 (අ) ඡේදය ප්‍රකාරව අස්ථිත්වයන් විසින් අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය කළ හැකි පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල එපරිද්දෙන් අයවැයගත සංඛ්‍යා ඇතුළත් කර නොතිබුණි. | අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපනය කළ හැකි පරිදි 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යාවන් සහිතව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 48 ඡේදය අනුව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද, ආදර්ශ පොල් උයන් ලෙජරයේ ජංගම ගිණුමේ රු. 29,990,706 ක බැර ශේෂය හා තවාන් ලෙජර ජංගම ගිණුමේ රු.4,675,275 ක හර ශේෂය එකිනෙකට හිලව් කර ශුද්ධ අගය වන රු.25,315,430ක් සදොස් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය වඩාත් පැහැදිලිව සහ සංක්ෂිප්තව ඉදිරිපත් කළ යුතු බැවින් ආදර්ශ පොල් උයන් ලෙජරයේ ජංගම ගිණුමේ රු.29,990,706 ක බැර ශේෂය හා තවාන් ලෙජරයේ ජංගම ගිණුමේ රු.4,675,275 ක හර ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට සටහන් කර ඇත. | වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකර ජංගම වත්කම් ශේෂ හා ජංගම වගකීම් ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන් වෙන්ව දැක්විය යුතුය. |
| (ඇ) 2013 වර්ෂයේදී දිගු කාලීන ආයෝජනයක් වශයෙන් ආරම්භ කර තිබුණු පාසිකුඩා සංචාරක ව්‍යාපෘතියෙහි ආයෝජිත රු.22,197,339 ක අගය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 76 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 07 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබුණ ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 13 හි 42 ඡේදය ප්‍රකාරව එම ආයෝජිත දේපළෙහි සාධාරණ අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. | සංචාරකයන්ගේ අවධානය දිනාගත් ස්වභාවික පිහිටීම සලකා බලා දිගුකාලීන ප්‍රතිලාභයක් ඉලක්ක කර ගනිමින් ආරම්භ කළ පාසිකුඩා සංචාරක ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය සමාලෝචනය කර ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව සාධාරණ අගය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරනු ඇත. | ආයෝජිත දේපළෙහි සාධාරණ අගය තක්සේරු කර ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි ඡේද අංක 118 ප්‍රකාරව ස්කන්ධයෙහි හඳුනා ගන්නා එක් එක් ආදායම හා වියදම සහ එක් එක් සංරචකය සඳහා හඳුනාගත් පෙර වර්ෂ වැරදි නිවැරදි කිරීම්වල ප්‍රතිඵල ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයේ පැහැදිළිව දැක්විය යුතු වුවද, මණ්ඩලයේ ප්‍රාග්ධන අරමුදල, පොදු අරමුදල, ප්‍රාග්ධන අරමුදල -කප්රුක හා ඇප ආවරන අරමුදල ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශයෙහි වෙන වෙනම දැක්වීම වෙනුවට සමුච්චිත අරමුදල නමින් එක් අයිතමයක් ලෙස දක්වා තිබුණි. එම අයිතමවලට අදාළව සමාලෝචිත වර්ෂයේ සිදු කර තිබුණු ගැලපීම්වල ශුද්ධ බලපෑම රු.49.110.416ක් පමණක් ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. එසේම මෙම ගිණුම් 03 ට අදාළ ලෙජර් ගිණුම් ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් අතර රු.501,767,769 ක වෙනසක් නිරීක්ෂණය වුවද, එම වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදිව දැක්වීමට කටුයුතු කරනු ලැබේ. | ස්කන්ධයෙහි හඳුනා ගන්නා එක් එක් ආදායම හා වියදම සහ එක් එක් සංරචකය සඳහා හඳුනාගත් පෙර වර්ෂ වැරදි නිවැරදි කිරීම්වල ප්‍රතිඵල ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයේ පැහැදිළිව දැක්විය යුතු අතර ලෙජර් ගිණුම් ශේෂයන් එලෙසම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් විය යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 ට අනුකූල නොවන ආකාරයට මුදල් හා මුදල් සමාන දෑ ලෙස සැලකිය යුතු මාස 03 න් කල් පිරෙන රු.11,476,390 ක කෙටි කාලීන ස්ථාවර තැන්පතුවලින්රු.6,131,032 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ද, රු.5,345,358 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ද දක්වා තිබුණු අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු මුදලින් ලද ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු.905,159 ක් ද, ලැබිය යුතු පොලිය රු.137,925 ක්ද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. එසේම මාස 03 න් කල් පිරෙන කෙටිකාලීන තැන්පතු රු.5,345,358 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් ගලායාම්, මුදල් ගලා ඒම් සහ කෙටිකාලීන තැන්පතු නිවැරදිව වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු මුළු පිරිවැය රු.375,410,404 ක් වූ ගොඩනැගිලි, මෝටර් වාහන, පරිගණක හා කාර්යාල උපකරණ ප්‍රයෝජනයට ගනිමින් පැවතුන ද, එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 අනුව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාහනවල දැක්වීමට කටයුතු කරනු ඇත. | ප්‍රයෝජනයට ගනිමින් පවතින වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 13 වන ඡේදය අනුව වත්කම හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වයට ගලා ඒම අපේක්ෂා කළ හැකි විට ජීව විද්‍යාත්මක වත්කමක් ලෙස හඳුනාගත යුතු වුවද, ආදර්ශ පොල් උයන් 12 හි කොස්, තේක්ක ආදී වර්ග 38 ක දැවමය වටිනාකමක් සහිත ගස් 7,936 ක් හා තවාන් 39 ක වර්ග 46 ක දැවමය වටිනාකමක් සහිත ගස් 5,525 ක් වශයෙන් එකතුව ගස් 13,461 ක් සහ තවාන් 39 ක පොල් ගස් 11,605 ක් ගිණුම්ගත කර නොතිබුණි. 2016 – 2021 අතර කාලය තුළ මේවායින් දැවමය වටිනාකමක් සහිත ගස් 373 ක් කපා ඉවත් කර ඇති බව ද වාර්තා වී තිබුණි. | ඉදිරි වර්ෂ කිහිපයක් තුළදී දැවමය වටිනාකමකින් යුතු ගස්වල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත. | අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වයට ගලා ඒම අපේක්ෂා කළ හැකි විට ජීව විද්‍යාත්මක වත්කමක් ලෙස හඳුනාගත යුතුය. ගස් කපා ඉවත් කිරීම යම් සම්මත ක්‍රමවේදයක් යටතේ සිදු කළ යුතුය. |
| (ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 16 වන ඡේදය අනුව ජීව විද්‍යාත්මක වත්කමක් මූලිකව හඳුනා ගැනීමේදී හා සෑම වාර්තාකරණ දිනයකදීම මැනිය යුත්තේ විකිණීමට වන පිරිවැය අඩුකර එහි සාධාරණ වටිනාකමට වුවද, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සතුන්ගේ බර අනුව ගණනය කළ රු.35,328,456 ක පශු සම්පත් හා රු.359,988,832 ක ස්ථාපිත කිරීමේ වියදම් ඇතුළත් ජීව විද්‍යාත්මක වත්කම් මැනීමේදී විකිණීමට වන පිරිවැය අඩු කර නොතිබුණි. තවද, එම ප්‍රමිතියේ 44 (අ) හා (ආ) ඡේද අනුව ජීව විද්‍යාත්මක වත්කම්හි ක්‍රියාකාරකම්වල ස්වභාවය හා කාල පර්ච්ඡේදය අවසානයේ කෘෂිකාර්මික නිෂ්පාදන නිමැවුම්වල භෞතික ප්‍රමාණයන්ගේ ඇස්තමේන්තු හෙළිදරව් කර නොතිබුණි. | මණ්ඩලයේ පොල් උයන් විසින් විකුණන ලද සතුන්ගේ බර අනුව මිල පසු සම්පත් මණ්ඩලය විසින් ලබාදී තිබූ මිල හා වෙළඳ පොල මිල යන දෙකම සලකා බලා අඩු අගයට මිල කර ඇත. 2022 වර්ෂයේ සිට නිවැරදිව ඉදිරිපත් කරන බව දන්වමි. | ජීව විද්‍යාත්මක වත්කම්වලවිකුණුම් වටිනාකමෙන් විකුණුම් පිරිවැය අඩු කර ඒවායේ සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

## 1.5.2 ගිණුම්කරණඅඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රධාන කාර්යාලය හා ආදර්ශ පොල් උයන් 12 ක ගනුදෙනු සම්බන්ධීකරණය සඳහා ප්‍රධාන කාර්යාලය හා ඊට අනුරූපීව ආදර්ශ පොල් උයන් පවත්වාගෙන යනු ලබන ලෙජර් පාලන ජංගම ගිණුම හා ආදර්ශ පොල් උයන් අතර පවත්වාගෙන ගොස් තිබුණු ජංගම් අතර රු.73,729,701 ක හර/බැර වශයෙන් වූ වෙනසක් ද, මණ්ඩලයට අයත් පොල් තවාන් 39 හි දෛනික වියදම් පාලනය සඳහා ප්‍රධාන කාර්යාලයෙහි පවත්වාගෙන යනු ලබන පාලන ගිණුම් අතර රු.4,675,275 ක වෙනසක් ද නිරීක්ෂණය වූ නමුත් මෙකී වෙනස්කම් පිළිබඳ සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ජංගම ගිණුම් 2000 වර්ෂයට පෙර සිටම සැසඳීමක් සිදුකර නොමැත. 2022 ගිණුම් වර්ෂයේදී එම වර්ෂයට ස්වාධීනව ගිණුම තුලනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර දීර්ඝ කාලයක් තිස්සේ ඉදිරියට එන තුලනය නොවූ ශේෂයන් පිළිබඳ සොයාබලා ගතහැකි වඩාත් සුදුසුම ක්‍රියාමාර්ගය ගන්නා බවද දන්වා සිටිමි. | වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලින් එම ශේෂ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2017 වර්ෂයේ පොහොර සහනාධාර ණයහිමියන් සඳහා 2018 වර්ෂයේදී ගෙවන ලද රු.7,893,816 ක් ණයහිමි ගිණුමට හර කිරීම වෙනුවට එම වර්ෂයේ වියදම්ගිණුමට හර කිරීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී රු.7,893,816 ක් වෙනුවට රු.13,510,360 ක් ණයහිමි ගිණුමට හර කර පෙර වර්ෂ ගැලපුම් ගිණුමට බැර කර තිබුණි. ඒ හේතුවෙන් ණයහිමියෝ හා සමුච්චිත අරමුදල පිළිවෙලින් රු.5,616,544 ක් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කරනු ලැබේ. | පොහොර සහනාධාර ණයහිමි ගිණුමට වැඩියෙන් හර කර ඇති රු.5,616,544 ඉවත් කළ යුතුය. |
| (ඇ) පොල් සංවර්ධන අධිකාරියෙන් 2019 වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු තැඹිලි ප්‍රවර්ධන ගාස්තුව පිළිවෙලින් රු.23,433,807 ක් හා රු.23,368,203 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.25,000,000ක් පමණක් ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම රු.1,631,797 ක් වැඩියෙන් ද, ලැබිය යුතු ආදායම රු.21,802,010 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | තැඹිලි වගා ප්‍රවර්ධනය සඳහා ලැබී 2020 වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර ඇති රු.25,000,000 ක මුදල ඉදිරියේ අදාළ ව්‍යාපාතිය ක්‍රියාත්මක වන අවසථාවක දී භාවිතයට ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. | තැඹිලි වගා ප්‍රවර්ධන ගාස්තු ලෙස උපචිත පදනමට ගිණුම් තැබීමටත්, තැඹිලි වගාව ප්‍රවර්ධනය සඳහා යෙදවීමටත් අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමයේ “ඇප ආවරණ” තැන්පත් බැංකු ගිණුම්වලට බැර කිරීම සඳහා 2020 දෙසැම්බර් 28 දින නිකුත් කළ නමුත් තැන්පත් ගිණුම්වලට බැර නොකර 2021 ජනවාරි දක්වා ළඟ තබාගෙන තිබුණු රු.26,411,351 ක් වටිනා චෙක්පත් 07 ක් සදොස් ලෙස ව්‍යාපෘතියේ වියදමක් වශයෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම වටිනාකමින් ව්‍යාපෘතියේ වියදම වැඩියෙන් ද, ඇප ආවරන තැන්පතු ගිණුමේ ශේෂය අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2021 වර්ෂයේ නිවැරදි කර ඇත. | “ඇප ආවරණ” තැන්පත් බැංකු ගිණුම්වලට බැර කිරීම සඳහා ලියන ලද චෙක්පත් අප්‍රමාදීව තැන්පත් ගිණුම්වලට බැර කර ගිණුම්කරණ දෝෂය නිවැරදි කළ යුතුයි. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ තොග පිළිබඳ භෞතික සමීක්ෂණ කටයුතු අවසන් කර තොගවල ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය නිවැරදිව හඳුනාගැනීමකින් තොරව රු.273,215,198 ක තොගවල පොත් අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට අවසන් කර ඇත. | භෞතිකව පවතින තොගවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළ යුතුයි. |
| (ඊ) | පෙර වර්ෂයේ ගොඩනැඟිලි අලුත්වැඩියා සඳහා දරන ලද රු.2,577,450 ක වියදමක් පෙර වර්ෂ ගැලපීමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ගොඩනැඟිලි ගිණුමට ප්‍රාග්ධනිත කර තිබීමෙන් ගොඩනැඟිලි පිරිවැය සහ සමුච්චිත අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කරනු ඇත. | පුනරාවර්තන වියදම ගොඩනැඟිලි ගිණුමෙන් ඉවත් කළ යුතුය. |
| (උ) | ඉන්දියාවේ පුද්ගලික සමාගමකින් කළු කුරුමිණි පෙරමෝන ආනයනය කිරීම සඳහා ණය ආවරණයක් ලබා ගැනීම පිණිස 2020 දෙසැම්බර් මස රු.2,417,120 ක් වටිනා ස්ථාවර තැන්පතුවක් ඇපයට තබා තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | මේ වන විට එම කාර්යය අවසන් වී ඇති හෙයින් එම සහතිකය නැවත මණ්ඩලයට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. ඉදිරියේදී මෙවැනි ගණුදෙනු මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ස්ථාවර තැන්පතු ඇපයට තැබීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුයි. |

| | | |
|---|---|---|
| (ඌ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මයිටා විලෝපිත තොගය රු.2,094,043 ක් වුවද, මයිටා ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ ලාභය ගණනය කිරීම සඳහා අදාළ කරගත් තොගය රු.1,495,920 ක් වූයෙන් රු.598,123ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා තුළ නිවැරදි කර ඇත. | වර්ෂය අවසාන ගණනය කිරීම් මත නිවැරදි අගයට තොග ගිණුම්ගත කළ යුතුයි. |
| (එ) 2018 වර්ෂයේ වැඩ ආරම්භ කළ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වැඩ අවසන් නොකළ යාපනය දේවපුරම් පොල් පැළ තවානේ තවාන්භාර නිලධාරී නිල නිවාසය ඉදි කිරීම සඳහා ගෙවා තිබූ මුදල රු.539,080 ක් වුවද, කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් වටිනාකම රු.263,450 ක් පමණක් විය. වෙනස වූ රු.275,630 කට හේතු ඉදිරිපත් කර නොතිබුණි. | නිවැරදි පිළිතුරක් ඉදිරිපත් කර නොමැත. | ගෙවා තිබූ මුදලට වඩා ගිණුම්ගත වී ඇති මුදල රු.275,630 ක් අඩුවෙන් දැක්වීමට හේතු සොයා බලා නිවැරදි කළ යුතුයි. |

## 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| බීජ පොල් හා පොල් පැළ මිලදී ගැනීම වෙනුවෙන් පොල් පර්යේෂණ මණ්ඩලයට ගෙවිය යුතු මුදල් | 17,244,333 | 28,794,390 | 11,550,057 | 2020.12.31 දිනට පොල් පර්යේෂණ මණ්ඩලයට බීජ පොල් වෙනුවෙන් රු.13,444,533 ක්ද, පොල් පැළ සඳහා රු.3,799,800.00 ක්ද වශයෙන් ගෙවිය යුතු මුළු මුදල රු.17,244,333.00 ක් වේ. | හේතු හඳුනාගෙන වෙනස ඉවත් කරගත යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ණයගැති ගිණුම් 26 ක් | 17,880,698 | ශේෂ සනාථන ලිපි | ණයගැති ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කරන ලෙස ලිපි නිකුත් කර ඇත. | ශේෂ සනාථන මඟින් ණයගැති ශේෂයන්හි භෞතික පැවැත්ම තහවුරු කළ යුතුය. |
| ස්ථාවර තැන්පතු | 30,415,239 | ලේඛනය හා උප ලේඛනය | 2021 වර්ෂයේදී ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් වෙනම උපලේඛනයක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර තැන්පතු සඳහා ලේඛනයක් නඩත්තු කිරීමටත්, ඒ ආශ්‍රයෙන් උපලේඛනයක් සකස් කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සේවය හැරගිය සේවකයින් 99 දෙනෙකුගෙන් වසර 01 ත් වසර 10 ත් අතර කාලයක සිට හිඟහිටව පැවති රු.1,446,465 ක ණය මුදලක් අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ. | හිඟහිටි සේවක ණය අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) 2013 හා 2014 වර්ෂයන්හි වැලිගම රෝග ව්‍යාප්ති වැඩසටහන හා කාබනික පොහොර වැඩසටහන වෙනුවෙන් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.6,573,572 ක් හා 2014 වර්ෂයේදී ලංකා සතොසට පොල් විකිණීමෙන් ලැබිය යුතු රු.302,288 ක් වශයෙන් එකතුව රු.6,875,860 ක් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.6,573,572 ක් සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා බව දන්වා සිටිමි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6.2 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉදිකිරීම් කාර්යයන් 25 කට අදාළ රඳවාගත් මුදල් රු.1,385,073 ක් වසර 03 ත් 06 ත් අතර කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු නොකර වෙළඳ ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | වසර දෙක ඉක්මවා ඇති රඳවා ගත් මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | පැරණි රැඳවුම් මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) දැනට සේවයෙන් ඉවත් වී ඇති සේවකයින් 08 දෙනෙකුගෙන් ලබාගෙන ඇති එකතුව රු.583,066 ක සේවක ඇප තැන්පතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වසර ගණනාවකට පෙර සේවය කරන ලද නිලධාරීන් 08 දෙනෙකු විසින් තබා තිබූ මෙම ඇප තැන්පතු පිළිබඳ වැඩි දුරටත් සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | සේවකයන් සේවයෙන් ඉවත්වීමේදී ඔවුන් නමින් ඇති ඇප තැන්පතු ශේෂයන් නිරවුල් කළ යුතුය. |
| (ඇ) මණ්ඩලයේ ආදර්ශ පොල් උයන්වල ග්ලිරිසීඩියා වගා කිරීමේ ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී අවසන් වී තිබුණ ද ඒ සඳහා ආයතන 03 ක් නමින් රු.4,676,402 ක ගෙවිය යුතු ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව වසර දෙකකට වඩා වැඩි බැවින් 2021 වර්ෂයේදී ආදර්ශ පොල් උයන් ආදායමට මාරු කිරීමට සටහන් කර ගන්නා ලදී. | ගෙවිය යුතු ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) 2011 හා 2017 වර්ෂවලදී නල ලිං ව්‍යාපෘතිය සඳහා රු.230,324 ක් හා පොහොර සහනාධාර ව්‍යාපෘතිය සඳහා රු.568,452 ක් වශයෙන් රේඛීය අමාත්‍යාංශයෙන් ලැබී උපයෝජනය නොකළ එකතුව රු.798,776 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර බැංකු ජංගම ගිණුම්වල නිෂ්කාර්යව තබා තිබුණි. | රජයේ ආදායමට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉටු නොකළ ව්‍යාපෘතීන්වලට අදාළ රජයේ මුදල් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (ආ) වගන්තිය | ස්ථාවර තැන්පතු ආයෝජනයක් සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු 18 ක | මින් ඉදිරියට ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය කිරීමක දී මුදල් පනත ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආයෝජිත රු.92,394,311 ක් සඳහා එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ. 137 සහ 138 | ගෙවීම් කිරීමට පෙර බලය ලත් නිලධාරීන් විසින් වවුචර්පත අනුමත කිරීමටත්, නිවැරදි සහ සෑම අතින්ම සම්පූර්ණ බවට සහතික කිරීමටත් කටයුතු කළ යුතු වුවද, රු.301,277 ක් වටිනා වවුචර් පත් 04 ක් අනුමත නොකර සහ රු.100,000,000 ක වවුචර්යක් සහතික නොකර ගෙවා තිබුණි. | ප්‍රවර්ථන වර්ෂය වන විට මූල්‍ය අංශය මඟින් ගෙවීමට ඉදිරිපත් වන සෑම වවුචරයක්ම මුදල් රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කර සියලු ඇමුණුම් සහ ගොනු සම්බන්ධතා සහ ගෙවීමේ විනිවිද භාවය තහවුරු කර ගැනීමෙන් පසුව අදාළ අනුමැතිය ලබාගෙන නියමිත වැය ලේඛනවල ඇතුළත් කිරීමෙන් අනතුරුව වවුචරය සහතික කර අදාළ ගෙවීම් සිදු කරනු ලබන බව දන්වා සිටිමි. | ගෙවීම් කිරීමට පෙර බලය ලත් නිලධාරීන් විසින් වවුචර්පත අනුමත කිරීමටත්, නිවැරදි සහ සෑම අතින්ම සම්පූර්ණ බවට සහතික කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ii) මු.රෙ. 381 | මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ජංගම ගිණුම් 10 සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන ඇති බවට නිරීක්ෂණය නොවූ අතර සේවකයන්ට උත්සව අත්තිකාරම් හා ආපදා ණය ගෙවීම සඳහා වෙන වෙනම ජංගම ගිණුම් දෙකක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳව ද කරුණු ඉදිරිපත් කර නොතිබුණි. | බැංකු ජංගම ගිණුම් විවෘත කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. සේවකයන් සඳහා උත්සව අත්තිකාරම් ගෙවනු ලබන ලංකා බැංකු ජංගම ගිණුමේ ඉදිරි අවශ්‍යතාවය සලකා බලා සමාලෝචනය කර වසා දැමීමට නියමිතය. | අනවශ්‍ය බැංකු ගිණුම් වසා දැමිය යුතුය. |
| (iii) මු.රෙ. 395 | එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙළ කර | බැංකු ජංගම ගිණුම් 03 ක බැංකු සැසඳුම්වල පැවති වැරදි 2021.12.31 දින වන විට නිවැරදි කර ඇති අතර 971 න් අවසන් වල ජංගම ගිණුමේ වැරදි නිවැරදි කරමින් පවතී. | සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර ගෙවන නිලධාරියා විසින් සහතික කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවන නිලධාරියා විසින් සහතික කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, විගණනයට ඉදිරිපත් කළ බැංකු ගිණුම් 03 කට අදාළ මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන 22 ක් බලය ලත් නිලධාරියා විසින් අනුමත කර නොතිබුණි. | | |
| (iv) මු.රෙ. 756 | 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එම වත්කම්වල පිරිවැය රු.1,289,265,602 ක් විය. | දේපළ, පිරියත හා උපකරණ භෞතික සමීක්ෂණය සම්බන්ධයෙන් පිළිතුරු ලබා දී නොමැත. | 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) II වැනි පර්ච්ඡේදයේ 13.3 ඡේදය හා 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය | පුරප්පාඩු වී ඇති තනතුරක වැඩබැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්කිරීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස බැවින් එහි උපරිම කාලය මාස 03 ක් පමණක් විය යුතු වුවද, පුරප්පාඩු වී පවතින තනතුරු 60 ක් සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් පත් කර ගැනීමට කටයුතු නොකර මාස 03ක සිට අවුරුදු 04 මාස 09 ක් දක්වා කාලයක් වැඩබැලීමේ පදනමින් පවත්වාගෙන ගොස් තිබුණි. මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ) තනතුර හා නියෝජ්‍ය | පුරප්පාඩුව පවතින තනතුරු සඳහා බඳවා ගැනීමට මූලික කටයුතු සිදුකර ඇතත් 2021.08.31 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව සියලු බඳවා ගැනීම් අධෛර්යමත් කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍යාංශ අනුමැතිය ලබාගැනිම සඳහා යොමුකර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ. | පුරප්පාඩුව ඇති තනතුරු සඳහා වහාම නිත්‍ය කාර්යමණ්ඩලය පත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති හා සංවර්ධන) තනතුර ද ඒ අතර විය. | | |
| (ii) VII වැනි පරිච්ඡේදයේ 12.2.6 ඡේදය | වැඩබැලීමේ වැටුප් ගෙවීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ වැඩ බැලීමේ වැටුප රු.4,925,474 ක් විය. | අදහස් දක්වා නොමැත. | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය නොමැතිව ගෙවන ලද වැඩ බැලීමේ වැටුප් නීත්‍යානුකූල නොවූ ගෙවීම් සේ සලකා ක්‍රියා කළ යුතුය. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 හා 5.2.5 ඡේද | මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අයවැය ලේඛනය අනුමත කර මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර එහි පිටපත් රේඛීය අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවද, අනුමත අයවැය ලේඛනයකින් තොරව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය කටයුතු කර තිබුණි. | 2020 මූල්‍ය වර්ෂය තුළ අතුරු සම්මත අයවැයක් මඟින් ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන යටතේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ වැය ශීර්ෂයන් මෙහෙයවන ලද අතර අනුමත ඇස්තමේන්තුවක් ක්‍රියාත්මක කර ඇත. | වාර්ෂික අයවැය ලේඛන සකස් කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.131,470,030 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.141,088,348 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,618,318 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩසටහන් වියදම පෙර වර්ෂයට සාපේක්ෂව රු.232,268,006 කින් වැඩිවීම මෙහෙයුම් ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පොල් වගා කිරීමේ මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනයේ පිරිවැය රු.1,513,300,588 ක් වූ දේපළ පිරියත හා උපකරණ තුළ වත්කම් බාණ්ඩ 07 ක පිරිවැය රු.86,383,238 ක වත්කම් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | පෙන්වා දී ඇති වත්කම් පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරි වර්ෂ වලදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලු වත්කම් නිශ්චිතව හඳුනාගෙන ලේඛනගත කළ යුතුය. |
| (ආ) 2016, 2017, 2018 හා 2019 වර්ෂවලදී වියදම්වලට හර කළ නමුත් ගොවීන්ගේ බැංකු ගිණුම්අක්‍රීය වීම නිසා නැවත මණ්ඩලයේබැංකු ගිණුමට බැර වී තිබූ රජයේ පොහොර සහනාධාර මුදල් රු.26,888,839ක් භාණ්ඩාගාරයට යැවීමට කටයුතු නොකර "අවලංගු චෙක්පත්" නමින් වගකීම් ගිණුමකට බැර කර නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරියට ගෙන එමින් පැවතුණි. | රජයේ ආදායමට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගොවීන් වෙත ලබා නොදුන් රජයේ පොහොර සහනාධාර මුදල් භාණ්ඩාගාරයට යැවිය යුතුය. |
| (ඇ) බැංකු ගිණුම් 03 ක එකතුව රු.65,989 ක හඳුනා නොගත් හර ශේෂයක් හා එකතුව රු.2,497,497ක හඳුනා නොගත් බැර ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු නොකර දීර්ඝ කාලයක සිට බැංකු සැසඳුම්වල ඉදිරියට ගෙන එමින් තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මාසික බැංකු ප්‍රකාශනවල ඇතුළත් සියලුම ලැබීම් හා ගෙවීම් නිවැරදිව හඳුනාගෙන ඒ ඒ මාසයේ ගිණුම් ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ආපසු නොගෙවීමේ අවධානම ආවරණය කර ගැනීම සඳහා ගෙවනු ලබන ණය ප්‍රමාණයෙන් මණ්ඩලය විසින් සියයට 10 ක් ද, බැංකුව විසින් සියයට 0.5 ක් ද වශයෙන් දායකත්වය දරමින් ඒ ඒ බැංකුවල පවත්වාගෙන යනු ලබන ඇප ආවරණ සාමාන්‍ය ඉතුරුම් ගිණුම්වල සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය රු.34,628,880 ක් වූ අතර ණය යෝජනා ක්‍රමය ආරම්භයේ සිට වසර 20 ක කාලයක් තුළ ණයකරුවන් 22 ක් වෙනුවෙන් ගෙවීමට සිදු වූ ඇප ආවරණය රු.1,770,326 ක් විය. | ගිණුම්වල තබා ගත යුතු මුදල තවදුරටත් අඩු කිරීමේ හැකියාව පිළිබඳ සොයා බලා අමතර මුදල් ඉහළ පොලී අනුපාතයක් ලබා දෙන රාජ්‍ය බැංකුවක ආයෝජනය කිරීමට කටයුතු කෙරෙනු ඇත. | මණ්ඩලයේ ඇප ආවරණ දායක අනුපාතය නැවත සමාලෝචනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඒ අනුව ණය ආපසු නොගෙවීමේ අවධානම ඉතා අවම මට්ටමක තිබියදී ලබා දුන් ණය මුදලින් සියයට 10 ක තරම් ඉහළ මුදලක් මණ්ඩලයේ දායකත්වය වශයෙන් සාමාන්‍ය ඉතිරි කිරීම් ගිණුම්වලට හිමි පොලිය යටතේ බැංකු ගිණුම්වල රඳවා තබා ඇති බවට නිරීක්ෂණය විය. | | |
| (ඉ) 2016 සිට 2019 දක්වා පසුගිය වර්ෂ 04 ක කාලය තුළ පිළිවෙලින් ගෙඩි 2,733,684 ක්, 737,418 ක්, 1,413,010 ක් හා 484,774 ක් වූ බීජ පොල් නිෂ්පාදනය සමාලෝචිත වර්ෂයේ දී ගෙඩි 327,587 ක් දක්වා පහත වැටී තිබුණි. | පොල් පැළ නිෂ්පාදනය සඳහා වෙන්වන මූල්‍ය ප්‍රතිපාදන අනුව බීජ පොල් සැපයීම වාර්ෂිකව අඩුවැඩි වීම සිදුවනු ලබයි. | වාර්ෂික පොල් පැළ අවශ්‍යතාවය හා තවාන්වල ධාරිතාවය සැලකිල්ලට ගෙන බීජ පොල් නිෂ්පාදනය සිදු කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ සභාපති, සාමාන්‍යාධිකාරී හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) ගෙන් සමන්විත පාලක සභාවකින් පාලනය වන, පෞද්ගලික විගණකවරුන් විසින් විගණනය කරනු ලබන මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදලේ රාජකාරී කළ නිලධාරිණියන් දෙදෙනෙකු විසින් 2015 - 2021 අතර කාලය තුළ අවස්ථා 50 කදී චෙක්පත් 50 ක් තමන්ගේ නමින් හා ඥාතීන්ගේ නමින් ලියාගෙන රු.73,839,369 ක අරමුදලේ මුදල් වංචා කර ඇති බව විශේෂ විමර්ෂණයක් මගින් අනාවරණය කරගෙන තිබුණි. අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කොට අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබීම, ගිණුම් පොත් පත් හා ලේඛන යාවත්කාලීන කර නොතිබීම, මූල්‍ය පාලන බලතල පැවරීමකින් තොරව එකම නිලධාරීන්ට වසර ගණනාවක් තිස්සේ අරමුදලේ කාර්යයන් සිදු කිරීමට ඉඩකඩ සලසා දී තිබීම, | මේ වන විට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරගනිමින් මූල්‍ය පාලන බලතල පවරීම, මානව සම්පත් කළමනාකරණ අංශයේ නිර්දේශ මත ගෙවීම් කිරීම, අභ්‍යන්තර විගණන අංශයේ පූර්ණ පරීක්ෂාවකින් පසුව චෙක්පත් පිළියෙල කර ගෙවීම් කිරීමට කටයුතු සිදුකරනු ලබයි. | අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම, අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම, ගිණුම් පොත් පත් හා ලේඛන යාවත්කාලීන කිරීම, මූල්‍ය පාලන බලතල පැවරීම, නිසි අභ්‍යන්තර මාරු ක්‍රමයක් සකස් කිරීම, අරමුදලේ කටයුතු කම්කරු කොමසාරිස්ගේ අවධානයට යොමු කරවීම, වංචා කළ මුදල් අයකර ගැනීමට හැකිවන ආකාරයට නඩු කටයුතු මෙහෙයවීම යනාදිය සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අරමුදලේ කටයුතු කම්කරු කොමසාරිස්ගේ අවධානයට යොමු කර නොතිබීම යනාදී කරුණු අනුව අරමුදලේ පාලක සභාව සිය වගකීම නිසි ලෙස ඉටු කර නොතිබීම මෙම වංචාවට හේතු වී ඇති බවට නිරීක්ෂණය විය. වංචා කළ මුදල් අයකරගෙන නොතිබුණු අතර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම මන්දගාමීව සිදු කරන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | | |
| (ආ) 1997 හා 1999 වර්ෂයන්හි මණ්ඩලයේ පොල් මිලදීගත් පෞද්ගලික සමාගම් දෙකකින් අයවිය යුතු රු.3,808,156ක් අය කර ගැනීමට නඩු පවරා තිබුණු නමුත් එම නඩු නිසි පරිදි මෙහෙයවා නොතිබීමෙන් වසර 23 ක් හා 24 ක කාලයක සිට එම මුදල් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙයින් රු.2,631,781 ක මුදලක් අයවිය යුතු ඩබ්ලිව්. ටී. වාස් සහ සමාගම සොයාගත නොහැකි බව දන්වා 2017 වර්ෂයේදී නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩුව අවසන් කර තිබුණු නමුත් එම සමාගම 2020 වර්ෂයේ තැරැව්කාර සමාගමක් ලෙස පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී පොල් වෙන්දේසි සඳහා සහභාගී වන බව නිරීක්ෂණය වීමෙන් මේවා මතභේදාත්මක ගනුදෙනු ලෙස නිරීක්ෂණය කෙරේ. | 1999 වර්ෂයේ සිට මේ දක්වා මෙම නඩුව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත. | නීතිමය කටයුතු නිසි පරිදි මෙහෙයවා මුදල් අයකර ගැනීමටත්, මණ්ඩලයේ නිලධාරීන් නිසි ලෙස රාජකාරි කටයුතු ඉටු නොකිරීම පිළිබඳව සොයා බලා විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2003 අංක 40 දරන පොල් සංවර්ධන (සංශෝධිත) පනතේ 20 වගන්තියේ ඇතුළත් බලතල හා කර්තව්‍ය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම සහ අපනයන අවශ්‍යතාවය සපුරාලමින්, ස්වයංපෝෂිත තත්ත්වය ළඟාකර | බාහිර පරිසරයේ සිදුවන බලපෑම් නිසා ක්ෂේත්‍රයේ සිටුවන පොල්වලින් ඵලදරණ ගස් බවට පත් වන ප්‍රමාණය සාමාන්‍යයෙන් සියයට 60 ක් පමණ වන හෙයින් 2003 වර්ෂයේ සිට මණ්ඩලය බෙදා හරින ලද පොල් පැළ | හඳුනා ගන්නා ලද ගැටලු අවම කර ගනිමින් ස්වයංපෝෂිත තත්ත්වය ළඟාකර ගැනීම පිණිස කාර්යක්ෂමව කටයුතු |

| | | |
|---|---|---|
| ගැනීම පිණිස ඵලදායී උපදේශන හා ව්‍යාප්ති සේවාවක් මගින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමත්, පොල් ඉඩම්වල ඵලදායීතාව ඉහළ නැංවීමත් තුළින් පොල් වගාකරුවාට ඉහළ ජීවන මට්ටමක් සාක්ෂාත් කරවීම මණ්ඩලයේ මෙහෙවර වූ අතර වාර්ෂිකව ඒ වෙනුවෙන් රු.මිලියන 638 ක වියදමක් දරා තිබුණි. එසේ වුවද, රටේ ආහාර, පොල් තෙල් ඇතුළු අනෙකුත් නිෂ්පාදන සහ අපනයන සඳහා සාමාන්‍ය අවශ්‍යතාවය වූ පොල් ගෙඩි මිලියන 3,418 කින් පොල් ගෙඩි මිලියන 626 ක හිඟයක් පවතින බවට නිරීක්ෂණය විය. | මිලියන 36.41 කින් ක්ෂේත්‍රයේ ස්ථාපිත වන ප්‍රමාණය මිලියන 21.8 ක් පමණ වේ. පොල් ඉඩම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් වයස්ගත වීමත්, නාගරිකරණයත් හේතුවෙන් වසරකට පොල් අක්කර 20,000කට අදාළ අස්වැන්න අඩුවීමත් සිදු වේ. ඒ අනුව 2003 – 2013 දක්වා වර්ෂ 11කදී දිවයිනේ පොල් ගස් මිලියන 14.08 ක ප්‍රමාණයක අස්වැන්න අඩුවීම සිදුවිය හැකි අතර ඉතිරිවන පොල් පැළ ප්‍රමාණය මිලියන 7.72 ක් පමණ ද, අක්කර 120,625 ක් පමණ ද වනු ඇත. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව 2002 සිට 2014 දක්වා වැඩි වී ඇති පොල් අක්කර ගණන 112,000 ක් පමණ වේ. | කරමින් පනතින් නියමිත කාර්යය ඉටු කළ යුතුය. |
| (ආ) 2003 අංක 40 දරන පොල් සංවර්ධන (සංශෝධිත) පනතින් මණ්ඩලයට නියම වී ඇති කාර්යයන් අනුව නිසි වගා ක්‍රම හඳුන්වා දීම පිණිස මණ්ඩලය විසින් ආදර්ශ පොල් උයන් 12 ක් පවත්වාගෙන යනු ලබන නමුත් ඒවායේ අක්කර 3,790.07ක් වූ මුළු භූමි ප්‍රමාණයෙන් පොල් වගා කර ඇති භූමි ප්‍රමාණය අක්කර 3,135.83 ක් ද, ඵලදරන පොල් වගා ඇති අක්කර 1,668.98 ක ඵලදරන පොල් ගස් 106,834 කින් 2020 වර්ෂයේ ඵලදාව ගෙඩි 5,024,208 ක් ද විය. එම ඵලදාව 2019 වර්ෂයට වඩා ගෙඩි මිලියන 1.47 ක් හෙවත් සියයට 23 කින් ද, ඇස්තමේන්තුගත පොල් ඵලදාවට වඩා ගෙඩි මිලියන 1.69 කින් ද අඩු අගයක් විය. පොල් උයන් 09 ක පොල් ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න ගෙඩි 60 කට වඩා අඩුවෙන් පැවතීම, පොල් පැල 24,209 ක් පාලු සිටුවිය යුතු වීම, සියයට 44 ක් වූ ගස් 106,834 ක් ඵල නොදරන ඒවා වීම, මයිටා හානිය හා වෙනත් සාධක හේතුවෙන් සියයට 26 ක් වූ ගෙඩි 1,300,617 ක් ඵලදායී නොවීම යනාදී කරුණු අනුව ආදර්ශ මට්ටමින් පොල් උයන් පවත්වාගෙන නොයන බවට නිරීක්ෂණය විය. | ජාතික අසවැන්න අඩුවීම, මණ්ඩලය සතු බොහෝ ඉඩම්වල S1 සහ S2 පාංශු කාණ්ඩ සහිත ඉඩම් නොමැති වීමෙන් දිගු නියං කාලවලදී ජලය හා පෝෂක රදවා ගැනීම අඩු වීම මත අස්වැන්න අඩුවීම, අතුරු බෝග වගාව හා සත්ත්ව පාලනය හේතුවෙන් පාලු පැළ සිටුවීමත්, සතුන්ගේ හානියෙන් තොරව පාලු පැළ රැක ගැනිමත්ගැටලු සහගත වීම යන කරුණු අනුව නියමිත ප්‍රතිඵල ලබා ගැනීම දුෂ්කර විය.කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රවාහන ගැටළු ඇතිවීම, පළපුරුදු සේවකයන් නොමැති වීම, කලටි කුරුවල් සහ කුඩා ගෙඩි ප්‍රතිශතය පාලනය කර ගැනිමට නොහැකි වීමද හේතු විය. | පනතින් නියම වී ඇති කාර්යයන් අනුව නිසි වගා ක්‍රම හඳුන්වා දීම පිණිස ආදර්ශ පොල් උයන් මනා අයුරින් කාර්යක්ෂමව පවත්වාගෙන යා යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පාසිකුඩා හා තර්මකර්නි යන ආදර්ශ පොල් උයන් දෙකෙහි 2020 වර්ෂයේ රු.16,133,667 ක් වූ ආදායම රු.8,926,381 කින් ඉක්මවා රු.25,060,048 ක වියදමක් දරා තිබීමෙන් එම පොල් උයන් දෙක දිගින් දිගටම අලාභදායීව පවත්වා ගෙන යනු ලබන බවට නිරීක්ෂණය වූ නමුත් ඊට අවශ්‍ය පිළියම් යොදා ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යුධමය වාතාවරණය අවසන් වීමෙන් පසුව මෙම පොල් උයන්වල පොල් වගා සංවර්ධන කටයුතු ආරම්භ කර පලෙයිහි පොල් පැළ 18357 ක් ද, පාසිකුඩාහි පොල් පැළ 9286 ක් ද සිටුවා මේ වන විට සියයට 30ක් පමණ ඵලදරන තත්ත්වයට පැමිණ ඇත. පැළ වගාවේ අස්වැන්න ලැබීමත් සමඟ ක්‍රමානුකූලව ඉදිරි වර්ෂ 03 තුළදී ලාභදායි තත්ත්වයට පත්වනු ඇත. | අලාභදායී වීමට හේතු සොයාබලා අවශ්‍ය පිළියම් යොදා ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) 2016 – 2018 වර්ෂ අතර කාලය තුළදී ප්‍රාදේශීය කාර්යාල මගින් ගොවීන් වෙත රු.1,002,721,100 ක පොහොර සහනාධාර මුදල් ගෙවා තිබුණ ද, ඒ පිළිබඳව පසු විපරමක් සිදු කර නොතිබීමෙන් රජයේ පොහොර සහනාධාර මුදල් ඵලදායීව යෙදවූ බවට සනාථ කළ නොහැකි විය. | අපගේ පොල් සංවර්ධන නිලධාරීන්ගේ නිර්දේශයට අනුව මෙම වැඩසටහන යටතේ පොහොර යෙදීම සඳහා ප්‍රතිලාභීන් විශාල සංඛ්‍යාවකට චෙක්පත් මගින් සහනාධාර මුදල් ලබාදුන් අතර පසුවිපරම් කිරීමට ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් අප සතුව නොවීය. | රජයේ පොහොර සහනාධාර මුදල් ඵලදායීව යෙදවූ බවට තහවුරුකර ගැනීම සඳහා නිසි පසු විපරම් සිදු කළ යුතුය. |
| (ඉ) දකුණු පළාතේ “වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය” හා “කොළ කුණුවීමේ රෝගය” පාලනය කිරීම සඳහා ඉවත් කරන ලද රෝගී පොල් ගස් 275,942 ක් සඳහා රු.580,956,180 ක වන්දි මුදලක් ඇතුළුව රෝගය පාලනය කිරීම සඳහා 2013 - 2020 කාලපරිච්ඡේදය තුළ රු.131,673,048 ක වියදමක් දරා තිබුණි. එසේ වුවද, 1999 අංක 55 දරන ශාක ආරක්ෂක පනතේ 4 (2) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව හඳුනාගෙන තිබූ රෝගී ගස් 11,240 ක් ගලවා විනාශ නොකිරීම හේතුවෙන් රෝගය මර්ධනය හෝ පාලනය කිරීමට නොහැකි වී තිබුණු බවට නිරීක්ෂණය විය. | රෝගී ලක්ෂණ පෙන්නුම් කරනු ලබන ගස්වල වැඩි ඵලදාවක් එම අවස්ථාවේදී පැවතීමෙන් වගාකරුවන් විසින් ඉවත් කිරීම සිදු වන්නේ නැත. එවිට මණ්ඩලය මගින් රසායන ද්‍රව්‍ය (ග්ලයිපොසේට්) යොදා විනාශ කරනු ලබයි. අදාළ කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ ග්ලයිපොසේට් රසායනිකය තහනම් කර තිබීම හේතුවෙන් එම ගස් ප්‍රමාණය විනාශ කර ගැනීමට නොහැකි විය. | ශාක ආරක්ෂක පනතේ විධිවිධාන ප්‍රකාරව රෝගය මර්ධනය හෝ පාලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) පොල් වගා පාදක ලාභදායී ව්‍යාපාරයක් ලෙස ආදර්ශන මට්ටමින් ආදර්ශ පොල් උයන් පවත්වාගෙන යමින් උසස් තත්ත්වයේ බීජ පොල්, පොල් පැළ ඇතුළු අතුරු භෝග හා අතුරු නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත බෙදා හැරීමේ අරමුණින් පොල් වගාවට අමතරව කොහු, කොප්පරා, පොල් කටු අඟුරු, පොල් ලෙලි චිප්ස්,පොල් තෙල්, පොල් පැළ, අතුරු | පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ සේවකයන්ගේ පැමිණීමේ දුර්වල තත්ත්වයක පැවති අතර, මේ වන විට නැවත ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතී. | පොල් උයන් ලාභදායී ව්‍යාපාරයක් ලෙස ආදර්ශ මට්ටමින් පවත්වාගෙන යා යුතුය. |

| | | |
|---|---|---|
| වගා පැළ හා පොහොර නිෂ්පාදනයත්, අතුරු භෝග වගා කිරීම, සත්ව පාලනය, සංචාරක නිවාස පවත්වාගෙන යාම හා කජ්තුරුපාය අලෙවිසැල් පවත්වාගෙන යාමත්, පොල් උයන්වල විභවය අනුව වී හා රබර් වගා කිරීමත්, පොල් සංචාරක ව්‍යාපෘතිය හා ග්ලිරිසීඩියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සිදු කළ යුතු විය. එසේ වුවද, සමාලෝචිත වර්ෂය වන විට පවත්වාගෙන ආ බොහෝ ව්‍යාපෘති නතර කර දමා තිබීමත්, නව ව්‍යාපෘති ආරම්භ කර නොතිබීමත් හේතුවෙන් පොල් උයන් ලාභදායී ව්‍යාපාරයක් ලෙස ආදර්ශ මට්ටමින් පවත්වාගෙන යන බවට නිරීක්ෂණය නොවිය. | | |
| (උ) සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් 07 ක් යටතේ වෙන් කර තිබුණු රු.මිලියන 800 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 226.72 ක් හෙවත් සියයට 28 ක් ඉතිරි වී තිබීම,පොල් පැළ 1,660,000 ක්සඳහා ලබාදීමට සැලසුම් කළ රු.83,000,000 ක සහනාධාර මුදලින්රු.49,983,200 ක් හෙවත් සියයට 60 ක් ඉතිරි කර තිබීම,තවත් වැඩසටහන් 04 ක ප්‍රගතිය සියයට 5 ත් 64 ත් අතර පරාසයක ප්‍රමාණයක් වීම යන කරුණු අනුව සැලසුම් කළ ප්‍රගතියට ළඟා වී නොමැති බවට නිරීක්ෂණය විය. | ප්‍රතිපාදනයෙන් රු. මිලියන 240 ක් දෙසැම්බර් මස ලැබී තිබීම හා කොවිඩ් වසංගත තත්ත්වය ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු සඳහා බලපාන ලදී. | නිසි සැලසුම්ගත වැඩපිළිවෙලක් යටතේ ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝගී කර ගනිමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ ආදර්ශ පොල් උයන්වලින් ලබා ගැනීමට සැලසුම් කළ පොල් ගෙඩි 6,735,000 කින් ලබාගත් ඵලදාව ගෙඩි 5,022,976 ක් වූ අතර කොහු කෙදි හා කොහු බත් නිපදවීම තුළින් රු.11,781,000 ක් හා සත්ව පාලන ව්‍යාපෘති තුළින්රු.16,914,764 ක් උපයා ගැනීමට සැලසුම් කළ ද, උපයාගත් ආදායම පිළිවෙලින් රු.3,491,040 ක් හා රු.7,608,885 ක් විය. තවද,ආදර්ශ පොල් උයන් 03 ක අතුරු භෝග පැළ අලෙවියෙන් උපයා ගැනීමට සැලසුම් කළ රු.4,878,000 ක ආදායම උපයා ගෙන නොතිබුණු අතරරු.27,158,090 ක ආදායමක් | රසායනික පොහොර නොයෙදීම, වර්ෂාපතනයේ අඩුවීම හා වැඩි උෂ්නත්වය ඵලදාව අඩුවීම කෙරෙහි බලපා තිබුණි. ප්‍රධාන කොහු ගැණුම්කරු වන චීනය කොහු ලබා ගැනීම නතර කළ බැවින් ප්‍රමාණවත් මිලක් නොලැබීම හා පැවති කොවිඩ් වසංගත තත්ත්වය මේ කෙරෙහි බලපා තිබුණි. | නිසි සැලසුම්ගත ඉලක්කයන් සහිතව ආදර්ශ පොල් උයන් කාර්යක්ෂමව මෙහෙයවා උපරිම කාර්යසාධන මට්ටමට ළඟා විය යුතුය. |

| | | |
|---|---|---|
| උපයා ගැනීමේ අපේක්ෂාවෙන් රු.12,701,010 ක වියදමක් දරා සිදු කළ අතුරු භෝග වගාවන් තුළින් උපයාගෙන තිබුණු ආදායම රු.4,986,688 ක් විය. මේ හේතුවෙන් ආදර්ශ පොල් උයන්වල සැලසුම්ගත ප්‍රගතියට ළඟා වී නොමැති බවට නිරීක්ෂණය විය. | | |
| (එ) දකුණු පළාතේ "වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය" හා "කොළ කුණුවීමේ රෝගය" පාලනය කිරීම සඳහා කපා දැමූ රෝගී ගස් 308,056 ක් සඳහා ලබා දී තිබුණු රෝගයට ඔරොත්තු දෙන ප්‍රතිරෝධී පොල් පැළ සංඛ්‍යාව 88,478 ක් පමණක් වීමත්, 2018 - 2020 කාලය තුළ ඉඩම් හිමියන්ට විකල්ප භෝග පැළ බෙදාදීම සිදු කර නොතිබීමත් හේතුවෙන් වගාකරුවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමේ කාර්යය නිසි ලෙස සිදු වී නොමැති බවට නිරීක්ෂණය විය. | මෙම රෝගයට ඔරොත්තු දීම සඳහා පොල් පර්යේෂණ ආයතනය මඟින් කොළ කුන්දිරා වර්ගයේ පොල් පැළ 5,200ක් ලබා දුන්නද, ඒවා ඉතා කුඩා පොල් ප්‍රභේදයක් වන බැවින් විකල්පයක් නොවන හෙයින් ආර්ථික වගාවක් ලෙස භාවිතා කළ නොහැක්කක් නිසා එම ප්‍රභේදයට අයත් පොල් පැළ ලබා දීම අත්හිටුවන ලදී. මේ දක්වා රෝගයට සුදුසු ප්‍රතිරෝධී පොල් ප්‍රභේදයක් පොල් පර්යේෂණ ආයතනය මඟින් නිර්දේශ කර නොමැත. මේ වන විට විකල්ප බෝග වගාවට කැමති වගාකරුවන් සඳහා අතුරුබෝග සහනාධාරයක් ලබාදෙනු ලැබේ. | රෝග පාලනය කරන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමටත්, වගාකරුවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමේ කාර්යය නිසි ලෙස සිදු කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මීගමුව බීජ පොල් උයනේ නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර නොගෙන එම ඉදිකිරීමට අදාළ ප්‍රසම්පාදන ලියවිලි, සැලසුම් හා ප්‍රමාන පත්‍ර සකස් කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේදී පෞද්ගලික උපදේශක සමාගමකට ගෙවා ඇති රු.2,149,273 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | වර්තමානයේ නව ඉදිකිරීම් සඳහා ලබා දී ඇති සීමා හා මූල්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගෙන කළමනාකාරීත්වයේ තීරණ අනුව ඉදිරි ගිණුම් කටයුතු සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී. | අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර නොගෙන කාර්යයන් ක්‍රියාත්මක නොකළ යුතු අතර නිෂ්කාර්ය වියදම් සඳහා වගකිව යුතු නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) පාසිකුඩාහි නිල නිවසක් ඉදි කිරීම සඳහා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.5 (අ) මාර්ගෝපදේශයට පටහැනිව | කාර්යයසාධනය ප්‍රමානවත් පරිදි සිදු නොවූ බැවින් 2016 වර්ෂයේ දී ඒකාබද්ධ මිණුම් ලබාගෙන කොන්ත්‍රාත්කරු විසින් නිමකරන ලද කාර්යය සඳහා ගෙවිය යුතු මුදල ඉදිකිරීම් උපදේශකගේ නිර්දේශයට | යෝජිත ඉදිකිරීම් නොපමාව සම්පූර්ණ කරවාගත යුතුය. |

| | | |
|---|---|---|
| ඉක්ටාඞ් ආයතනයේ (ICTAD) ලියාපදිංචිනොවූ කොන්ත්‍රාත්කරුවකු වෙත 2013 වර්ෂයේදී රු.10,321,851 කට පිරිනැමූ කොන්ත්‍රාත්තුවෙන් සියයට 94 ක් වන රු.9,697,964 ක් ගෙවා තිබියදී 2015 වර්ෂයේදී අතරමඟ නතර කර තිබුණු අතර 2016 වර්ෂයේදී කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි. | අනුකූලව ගෙවා එම කොන්ත්‍රාත්තුව අත්හිටුවා ඇත. | |
| (ඇ) කුරුණෑගල ප්‍රාදේශීය කළමනාකරු නිල නිවසේ කොන්ත්‍රාත් වටිනාකම රු.2,108,886 ක් වූ දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට භාර දී 2015 වර්ෂයේදී රු.744,405 ක මුදලක් ගෙවා තිබියදී අතරමඟ නවතා දමා තිබුණුඅතර ගෙවූ මුදල් වසර 06 ක් තිස්සේ කෙරීගෙන යන වැඩ ගිණුමේ රඳවා ගෙන තිබුණි. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කොට මුදල නැවත අයකර ගැනීමට කටයුතු කරමි. | මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 918 ක් ද, තත්‍ය කාර්ය මණ්ඩලය 664 ක් ද වූ අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති හා සංවර්ධන) යන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 02 ක්, මධ්‍යම මට්ටමේ කළමනාකරණ තනතුරු 08 ක්, කනිෂ්ඨ කළමනාකරණ තනතුරු 51 ක්, කළමනාකරණ සහකාර තනතුරු 165 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 28 ක් වශයෙන් පුරප්පාඩුව පවතින තනතුරු 254 | බඳවාගැනීම් අධෛර්යමත් කිරීම නිසා මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. | සුදුසු පරිදි බඳවා ගැනීමට හෝ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය නැවත සලකා බලා සංශෝධනය කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ක් සම්පූර්ණ කර ගැනීමට හෝ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය නැවත සලකා බලා එය සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | | |
| (ආ) කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියෙන් පවත්වා ගෙන යන වතු අංශයේ 145 ක් වූ නිත්‍ය කාර්ය මණ්ඩලයෙන් 43 ක් ද, 10 ක් වූ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයෙන් 08 ක්ද පුරප්පාඩු වී පැවතීම ආදර්ශ පොල් උයන් 12 හි කටයුතු මනා ලෙස පවත්වාගෙන යාම කෙරෙහි බලපානු ලබන බවට නිරීක්ෂණය විය. | ආදර්ශ පොල් උයන් වල ඵලදායිත්වය පවත්වාගනිමින් අත්‍යාවශයෙන්ම බඳවා ගත යුතු තනතුරු පුරප්පාඩු පිළිබඳව සහ සංඛ්‍යාව පිළිබඳ නිර්දේශ ලබාගෙන බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | සුදුසු පරිදි බඳවා ගැනීමට හෝ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය නැවත සලකා බලා සංශෝධනය කර ගැනීමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස 09 දින 15 ක ප්‍රමාදයකින් පසු 2021 නොවැම්බර් 15 දින ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි වර්ෂවල දී මෙම ප්‍රමාද දෝෂයන් වලක්වා ගැනීමට අවශ්‍ය සියලු උත්සාහයන් දරන බව දන්වා සිටිමි. | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |